
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

*Phone* : **020 74289388**
*Fax* : **0871 9005163**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : **Daya Ananda Ranasinghe**
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## මාස්ටර් සර් නිදහස දෙනවාද?

**ගි**ය සතියේ ශ්‍රීලංකාව යටත් විජිත භාවයෙන් නිදහස්වීම සැමරුවා ය. අප දන්නා කාලයේ සිට පෙබරවාරි 4 වෙනිදා අප රටේ ජනතාව උත්සව පවත්වා, ජාතික ගීය ගයා අධිරාජ්‍යවාදීන්ගෙන් අප ලැබූ නිදහස සමරති. එහෙත් මේ කාරණය ගැන මෑතකදී මගේ කල්පනාව වෙන අතකට යොමුවිය. අප සැබැවින්ම නිදහස ලබා ඇද්දැයි බැලිය යුත්තේ වර්තමානයේ අපට සිදුවන හා මත්තට ද සිදුවෙතැයි නිසැකවම සිතෙන බොහෝ කාරණා ආශ්‍රයෙනි. ඒ අනුව නම් ලංකාවට කිසිදාක නිදහසක් ලැබේදැයි මට නම් සැක සහිතය. මේ සටහන ලියන්නේ එය විස්තර කිරීම පිණිස ය.

ආසියානු රටවල් සමග ඇමරිකාව ද බටහිර බොහෝ රටවල් ද මිත්‍රත්වයෙන් ඉන්නා බවක් පෙන්නුම් කළත් ඔවුන් සැබැවින්ම මිත්‍ර නැත. අධිරාජ්‍යයේ ග්‍රහණයේ සිටි බොහෝ ආසියානු රටවල් ඒ පීඩනයෙන් මිදෙන්නට අවුරුදු සිය ගණන් පවා මහන්සි ගත් හැටි අපේ රටේ ඉතිහාසය දෙස බැලීමෙන්ම පමණක් අපට වටහාගත හැකි ය. අවසානයේ ඔවුන් නිදහස දුන්නේ නොදී බැරිකමට මිස කිසිදු කැමැත්තකින් නොවේ. සිය මිටෙන් අතහැරුණු රටවල් දෙස ඔවුන් බලන්නේ හිත හොඳින් නොවේ. තරහෙනි. හැකි හැම විටකම ඒ රටවලට කිසියම් කෙණහිල්ලක් කරන්නට මාන බලති. එසේ නැතහොත් තවමත් පරණ තාලයට ආණ්ඩු මට්ටු කරන්නට සූදානම් වෙති. අප කල්පනා කළේ අධිරාජ්‍යවාදීන් අතීතයේ කුමන බිහිසුණු අමානුෂික දේ කළත් දැන් ඔවුන් හොඳ නරක තේරුම් ගෙන ශීලාචාර මිනිසුන් ලෙස සමස්ත ලෝකයේ ම යහපත තකා ශික්ෂිතව කටයුතු කරනවා ඇත කියා ය. නමුත් එහෙම වෙන පාටක් නැත.

ශ්‍රීලංකාව අවුලෙන් අවුලට පත්වෙනවා නම් බටහිර ද ඇමරිකාව ද කැමති ය. කොටි ත්‍රස්තවාදය මෝරන්නට පැලවෙන්නට වතුර ඉස්සේ සාත්තු කළේ නෝර්වේ ඇතුළු බටහිර රටවල් ය. ඔවුන් හිතුවේ අපට කවදාවත් කොටි හැති කරය පරාජයකරන්නට බැරිවේය කියායි. BBC ඇතුළු බ්‍රිතාන්‍යයේ රූපවාහිනී මාධ්‍යය හා පුවත් පත් පසුගිය කාලය මුළුල්ලේ ම කළේ හා තවමත් කටයුතු කරන්නේ කොටි ත්‍රස්තවාදීන්ට පක්ෂව බව අපි කවුරුත් හොඳාකාරව දැන සිටිමු. මාධ්‍ය නිදහස යයි මොවුන් කියන නමුත් එය මාධ්‍ය නිදහසක් නොවේ. ඒ තවමත් අධිරාජ්‍යවාදී ලෙස මහන්තත්වයෙන් සිතන අප තවම ඔවුන්ගේ වහළුන්ලෙස සිතීමේ ප්‍රතිඵලයයි.

පරාජය කළ නොහැකියයි සිතූ කොටි අවසන් හුස්මහෙළන කිට්ටුව මේ බටහිරයන් යුද්ධය නවත්වා කොටි බේරාගන්නට කළ පුදුම වෑයම අපට මතක නොවේ ද? ශ්‍රීලංකා රජය කොටි සමූලඝාතනය කළාට පසු හිත අමාරුවුණේ කොටි ඩයස්පෝරාවට වඩා බටහිර රටවලට හා බටහිර මාධ්‍යයට ය. අපේ වීරක්‍රියාවට ඔවුන් එකද අත්පුඩියක් වත් නොගැහුවේ ඒ නිසාය. මේ වර රාජපක්ෂ රජය බිඳවැටේයයි බලාගෙන සිටියත් එසේ නොවීම බටහිරට හිතට අමාරුය. අහස පොළව කිසිදා එක්වේද? බටහිර හා නැගෙණහිර ද හැමදා එසේම ය.

# ජාතික නිදහස දේශයක අභිමානයයි

***එක්සත් රාජධානියේ තේම්ස් විහාරවාසී***
**රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍ය පන්නල සුමේධ ස්ථවිර**





**ශ්‍රී**ලංකාව නිදහස්, නිවහල්, සෛවරී රාජ්‍යයක් බවට පත්වන්නේ 1978 දෙවැනි ජනරජ ව්‍යවස්ථාව සම්මත කරගැනීමෙන් අනතුරුවය. එහෙත් ක්‍රි ව 1815 මාර්තු 2 දා උඩරට ගිවිසුමෙන් මහා බ්‍රිතාන්‍යයට යටත් වූ ශ්‍රීලංකාව නිදහස ලබන්නේ ඩී. ඇස්. සේනානායක පාලන සමයේ 1948 පෙබරවාරි 4 වෙනි දිනයි.

මේ නිසාම අපි ජාතික නිදහස් දිනය ලෙසට පෙබරවාරි 4 වන දිනය ඉතා උත්කර්ෂවත් ලෙසට සිහිකරමු. ලොව කවර රටක සිටියද අපි ශ්‍රීලාංකිකයින් ලෙසට අපේ රටේ නිදහස සංවර්ධනය හා සමෘද්ධිය ප්‍රාර්ථනා කරමු. මෙහිදී ජාතියක් වශයෙන් අපේ අතීත විරුවන් සිදු කළ ජාතික මෙහෙවරත්, රට ජාතිය වෙනුවෙන් ඔවුන්ගේ ඇප කැපවීමත් සිහිපත් කළ යුතු අතර, අපේම පෞඪ ඉතිහාසයද වසර දෙදහසකට ආසන්න සංස්කෘතික උරුම යන්ද සිහිපත් කළයුතු වේ. විජයාගමනය සිදුවූයේ 5 වන සියවසේ වුවද එම පරපුරේ ශ්‍රේෂ්ඨ තම ආදර්ශවත් පාලකයා වන්නේ පණ්ඩුකාභයයි. අභය නමින් හැඳින්වුණ රාජ පරපුරක්ම බිහිවන්නේ මෙම රජුගේ ශ්‍රෙෂ්ඨත්වය පසුකාලීන පාලකයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ හෙයිනි. මෙයින් පසු වරින්වර දකුණු ඉන්දියානු ආක්‍රණිකයන් විසින් මේ සුන්දර දිවයින ආක්‍රමණය කරන ලද අතර ඉන් බලවත්ම විදේශිකයා වූයේ එළාල හෙවත් එලාර නම් චෝල දේශීය ආක්‍රමණිකයාය.

අනුරාධපුරය අතහැර දමා රෝහණ දේශයට පළාගිය අපේ නායකයින් අතර කාවන්තිස්ස රජතුමා විහාරමහාදේවිය සරණපාවා ගෙන කැළණිය දක්වාත්, සෝමා දේවිය නම් සහෝදරිය විවාහ කර දී සේරුවාවිල සෝමාවතී ප්‍රදේශ දක්වාත් අල්ලාගෙන, දස මහා යෝධයන්ගෙන් සන්නද්ධ කර, දුටුගැමුණු හෙවත් තම දෙටු පුත් ජෙට්ඨ ගාමිණී අභය කුමරුට අනුරපුර ජයබිම දිනාගැනීමට අවස්ථාව සලසාදුනි. අනතුරුව වසර සියයකට පසුව සද්ධාතිස්ස රජුගේ පුත් වට්ටගාමිණී අභය හෙවත් වළගම්බා යුගයේදී වසර 12 ක මහා සංග්‍රාමයකින් පසුව අනුරාධපුරය නිදහස් කරගනු ලැබිණ.

ඉන් පසු සෑම ශතවර්ෂයක දීම දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ට යටත්වූ අප රට, හැම විටම නිදහස් සටන් තුළින්ම ජයගන්නා ලදී. 2 වන මහින්ද රාජ සමයේ දී අනුරාධපුරය ආක්‍රමණිකයන්ට යටත්වූ අතර, 1 වන මහා විජයබාහු රජතුමා වසර 12 ක් පමණ සටන්කර නිදහස්කර ගත්තේය. එතුමා රාජ්‍යය දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ගෙන් නිදහස් කරගැනීම සඳහා අගනුවර පුලස්ථිපුරය හෙවත් පොළොන්නරුව බවට පත්කරගන්නා ලදී.

එහෙත් සංස්කෘතියෙන් භාෂා සාහිත්‍ය යන්ගෙන් අභිවෘද්ධියට පත්, වාරි කර්මාන්තය නිසා ස්වයංපෝෂිත වූ පොළොන්නරුව දකුණු ඉන්දීය ආක්‍රමණයන්ට ගොදුරු වීය. ඒනිසාම 1 වන මහා පරාක්‍රමබාහු රජතුමාට දීර්ඝකාලීන අරගලයක් කර, මායා රට දැදිගම සිට සටන් අරඹා, සුගලා දේවිය, ජයබාහු වැනි දේශීය බලවතුන්ද යටත්කර අති උතුම් රාජ්‍යයක් පුලතිසිපුරයේ ගොඩනගා පසුකාලීන පරාක්‍රමබාහු රජ පරපුරක්ම ඇති කරන ලදී. ලීලාවතී, කල්‍යාණවතී රාජිණියන් ගෙන් අනතුරුව නිශ්ශංක මල්ල රජ පාලනය කළ අතර පසුකාලීන රටම විනාශකළ ආක්‍රමණිකයා වූයේ කාලිංග මාඝයි.

කාලිංග මාඝ පොළොන්නරුව විනාශකරද්දී 3 වන විජයබාහු මහියංගනයේ සිට පැමිණ දඹදෙනියේ ආරක්ෂක කඳවුරු පිහිටුවාගෙන සුභ සෙනෙවියාගේ උපකාරයෙන් මාඝට මුහුණ දුන්නේය. එහෙත් කාලිංග මාඝ පරාජයකර පළවා හරින ලද්දේ විජයබාහු රජුගේ පුත් 2 වන පණ්ඩිත පරාක්‍රමබාහු රජ තුමා විසිනි. දඹදෙණියුගයේදී ජාවක චන්ද්‍රභානු, සුන්දර පාණ්ඩ්‍ය වැන්න වුන්ගේ ආක්‍රමණ පැවති අතර, කෝට්ටේ රාජධානි සමයේදී චන්ද්‍රභානුගේ පිරිස යාපන අර්ධ වීපයේ බලය පිහිටුවා කෝට්ටේ රාජ්‍යයට තර්ජණ එල්ල කළවිට සපු මල් කුමරු ගොස් මැඩපවත්වා නිද හස් කරගත්තා පමණක් නොව ඒකීය රාජ්‍යයක් බවටද පත්කරන ලදී.

අනතුරුව අපේ රටේ නිදහස 1505 සිට පෘතුගීසීන්ද 17 වන සියවස ලන්දේශීන්ද 18 වන සියවස ඉංග්‍රීසීන්ද යටත් කරගත් අතර අවසානයේ අප ඉංග්‍රීසීන්ගේ යටත් විජිතයක් බවට පත්විය.

කුඩා රාජ්‍යයක්, කුඩා දිවයිනක් වුවද මේ සෑම අවස්ථාවකදීම ශ්‍රීලාංකික වීරවරයෝ අභීත සංස්කෘතියක් පෞඪත්වයක් ප්‍රදර්ශණය කරමින් තම මාතෘභූමිය නිදහස් කරගැන්මට ඇප කැපවී ක්‍රියා කළහ. ඒ අනුව පෙරදිග ලෝකයේ මුතු ඇටයක් ලෙසටත්, ධාන්‍යාගාරයක් මෙන්ම ධර්මද්වීපයක් ලෙසටත් හැඳින්වුනේ සදාචාරවත් ජනතාවක් වසර දහස් ගණනක් මේ නිජභූමියේ රැඳී සිටි නිසයි.

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### *හිතොපදේශයෙන්*

**දානොපභොග රහිතා - දිවසා යස්‍ය යාන්ති වෙ**
**ස කර්මකාර භස්‍රෙව - ස්වසන්නාපි න ජීවති**

***අර්ථය*** : *යමෙකුගේ දවස් දන් දීමෙන් හා වස්තු පරිභෝගයෙන් තොරව ගෙවීයන්නේද, හෙතෙම ඒකාන්තයෙන් මයිනහමක් මෙන් සුසුම් හෙලන්නේ නමුදු ජීවත් නොවේ.*

මිනිසුන්ගේ ජීවිතයක හරවත් බව හා අර්ථවත් බව වැනි වටිනා ආදර්ශයක් මෙම පද්‍යයෙන් විස්තර කර ඇත. ජීවිතයක වටිනාකම රඳා පවතින්නේ ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාකාරකම් මතය. එම ක්‍රියාකාරකම් උසස් වන තරමට ම ජීවිතයේ වටිනාකමද උසස් ය. ජීවිතයක ප්‍රධාන පැතිකඩ දෙකකි. එකක් ලෞකික පැත්තයි. අනික අධ්‍යාත්මික පැත්තයි. ලෞකික ජීවිතය මෙන්ම අධ්‍යාත්මික ජීවිතයත් මේ දෙකම හැම කෙනෙකු විසින්ම සමව තබාගත යුතු ය. ජීවිතයේ මේ අංශ දෙකම වර්ධනය කරගත යුතු ය. අධ්‍යාත්මික ජීවිතය අමතක කොට ලෞකික ජීවිතය පමණක් පෝෂණය කිරීම ජීවිතයේ නියම පරමාර්ථය කරා ළඟාවීමක් නොවේ. රථයක රෝද සම මට්ටමේ පවතී නම් ගමන පහසු ය. එසේ නොවේ නම් තමා බලාපොරොත්තු වන ගමන යාම උගහට ය. ජීවිතයත් එසේ ය.

මෙම පද්‍යයෙන් ප්‍රධාන වශයෙන් පෙන්වා දෙන්නේ දීම හා පරිභෝජනය කියන දෙක එදානෙදා ජීවිතයට සම්බන්ධ කරගත යුතු බවයි. කෙනෙකු දැහැමිව උපයන දෙයින් ස්වල්පයක් හෝ අනුන් වෙනුවෙන්ද පරිත්‍යාග කිරීම දානය හෙවත් දීමයි. එමෙන්ම අනුන්ට උදව් උපකාර කිරීම ද මෙම ගනයෙහි ලා සැලකිය හැකියි. පරොපකාර, ප්‍රත්‍යුපකාර සහ යුතුකම් ඉටුකිරීම යන සමාජ ආචාර ධර්ම උසස් චරිතයක උදාර ගුණාංග ය. මෙම පද්‍යයට අනුව දානය යන වචනයෙන් මේ හැම එකක්ම සංකේතවත් කරයි.

අනෙක් කාරණය පරිභෝජනයයි. තමන් දැහැමින් සපයාගත් දෙය අනුන්ට කරදරයක් නොවන විදියට පරිහරණය කිරීමයි. ලෞකික ජීවිතය හොඳින් පවත්වාගෙන යාමට ආර්ථික ස්ථාවර භාවයක් තිබිය යුතුයි. ඒ සඳහා නිවැරදි ක්‍රමෝපායන් අනුගමනය කළ යුතුවා මෙන්ම ඒවා භුක්ති විඳීමද අනුන්ට පීඩාවක් නොවිය යුතුයි.

කෙනෙකු හොඳින් ජීවත්වෙනවා යනු ඉහත දැක්වූ කාරණා දෙකට යෝග්‍යව කටයුතු කිරීමයි. තමන්ගේ සුබ විහරණය සඳහා අනුන්ට කරදරයක් හිරිහැරයක් නොවන විදියට දැහැමිව ඉපයීමත්, ඒ උපයාගත් දෙය අනුන්ට පීඩාවක් නොවන ආකාරයට භුක්තිවිඳීමත්, අනික් අතට තමා ඉපයූ දෙයින් ස්වල්පයක් හෝ පිනට දහමට යෙදීමත්, යුතුකම් ඉටුකිරීමත් කියන මේ ආකාරයට කටයුතු කරන්නේ නම් ඔහුගේ ජීවිතය සාර්ථකයි. එසේ නොකරන්නන්ගේ ජීවිතය හරසුන් ය. හිස් ය. ඒක හරියට මයිනා හමක් වැනියයි උපමාවක් වශයෙන් මෙහි දක්වා ඇත.

කම්මල්කරුවා මයිනහම පාවිච්චි කරන්නේ යකඩ රත්කර ගැනීම සඳහා ගිනි මෙලවීමටයි. එහි ක්‍රියාකාරීත්වය වායුව ඇතුළට ඇදගෙන පිටකිරීමයි. හරියට කෙනෙකු හුස්ම ගෙන පිටකිරීම හා සමානයි. මයිනහම කෙනෙකුගේ නිර්මාණයක් මිස ජීවියෙකු නොවේ. මෙම පද්‍යයේ සඳහන් ආකාරයට මුලින් සඳහන් කරන ලද ගුණ ධර්ම දෙකින් තොර පුද්ගලයාගේ ජීවිතයද කම්මල්කරුගේ මයින හම හා සමානය.

කෙනෙකු ජීවත්වෙනවා කියන්නේ හුස්මගැනීම පමණක් ම නොවේ. උතුම් ජීවිතය යනු ගුණ ධර්මවලින් පෝෂිතව තමන්ට මෙන්ම අනුන්ට ද වැඩ සිදුකිරීමයි. තමාගේ අභිවෘද්ධිය සලසාගැන්ම හා සමාජයට සේවය කිරීමයි. එමෙන්ම ලෞකික හා ලෝකෝත්තර දියුණුව සලසාගැනීමයි.
එවන් ජීවිතයම හරවත් බවින් පිරිපුන් ය.
එවන් චරිතය උදාර ය.



**රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති**
♦ ***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**The Avenue, Bedford Park,**
**London W4 1UD**

**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**